

# ඔස්ට්‍රේලියා රජයෙන් ගෞරව සම්මාන ලද නීතිඥ මෛත්‍රී පනාගොඩ

**ජගත් ජේ එදිරිසිංහ**

මෛත්‍රී පානාගොඩ ශ්‍රී ලාංකික ජන සමාජයට සමීපවන්නේ නීතිඥයකු නිසාම නොවේ. ඔහු විටෙක සිය අනන්‍යතාව නොමැකෙන ලෙස සනිටුහන් කළ කලාකරුවෙකි. තවත් විටෙක ඔහු නිද්‍රාශීලී සමාජයක් අවදි කරන සමාජ සේවකයෙකි. ඔහු අතින් ලියැවී ආචාරීය ප්‍රේමසිරි කේමදාසයන් ගේ සංගීත නිර්මාණයෙන් ඩී ඩී ගුණසේන ශූරීන් ගයන ගයන "සොඳුර මට සමුදෙන්න" නීලා වික්‍රමසිංහ ගයන " අහස බලාපන් පුතුනේ" ටී එම් අජයරත්න සහ නීලා වික්‍රමසිංහ ගයන "හෙට උපදින පුංචි පුතේ" නිරංජලා සරෝජිනී ගයන "සුදු වැලි මතුපිට" අබේවර්ධන බාලසූරිය ගයන "ජීවිතයේ තණ නිල්ල දිගේ" එච් ආර් ජෝතිපාල ගයන "මම යනවා මම යනවා" වැනි සදාතනික ගීත කලාකරුවකු ලෙස මෛත්‍රී සතු ප්‍රතිභාව මනාව පැහැදිළි කර දෙයි.

බොහෝ කාලයක් නිහඬ සේවයක නිරතව සිටින මෛත්‍රී දැන් ඔස්ට්‍රේලියා රජයේ සම්මානයට පාත්‍රව සිටින්නේ සුදුස්සාට සුදුසු තැන ලැබිය යුතුය යන්න නැවත පසක් කරවමිනි. ඔස්ට්‍රේලියා රජය වසරකට වරක් බ්‍රිතාන්‍යයේ මහ රැජිනගේ ජන්ම විනය දා පිරිනමන ගෞරව සම්මානයට මෛත්‍රී පාත්‍රව සිටීම සමස්ථ ශ්‍රී ලාංකික ප්‍රජාවටම ගෞරවයකි.

සම්මාන මෛත්‍රීට අලුත් අත්දැකීම් නොවේ. ඔහු ප්‍රථම වතාවට සම්මානයට පාත්‍රවන්නේ පාසල් සිසුවකුව සිටියදී ය. මෛත්‍රී කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදිශිෂ්‍යයෙකි. 1968 - 69 දී අපොස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ පරීක්ෂණ වෙනුවෙන් විද්‍යා සහ කලා විෂය ක්සෙත්‍ර දෙම හදාරා සමත් වන ඔහු ඒ සමත්කම වෙනුවෙන් එවකට ශ්‍රී ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා වූ විලියම් ගොපල්ලව මැතිඳුන් අතින් රන් වර්ණ සම්මානයට පාත්‍ර විය.

“The Stolen Generations project is the biggest achievement in my career. Not many law firms would have ventured into this area because it’s a significant investment in time and money and the outcome is uncertain, but we have been able to get results mainly because of our approach with the parties.”

MAITHRI PANAGODA

පාසල් සිසුවකුව සිටියදීම පුවත්පත් වලට ලිපි සපයන මෛත්‍රී 70 දශකයේ ගුවන්විදුලියේ මුල් ගැන ගත් ප්‍රබුද්ධ ගී පබැඳින්නට යොමු වන්නේ සිංහල භාෂාව පිළිබඳව ඔහු සතුව තිබූ විසල් දැනුම නිසා ය. අප මේ ලිපිය මුළ දී සඳහන් කළ සදාකාලික නිර්මාණ සමස්ථ ශ්‍රී ලාංකික සමාජයට පුද කර ඔහු නිහඬව සිටින්නේ පිරිපුන් මිනිසකු සතු නිහතමානී බව ප්‍රද්ර්ශනය කරමිනි.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතිය හදාරා 1975 වසරේදී එංගලන්තය බලා යන මෛත්‍රී එහි වසර 40 කට වැඩි කාලයක් පළමු පෙළේ නීතිඥවරයකු ලෙස සේවය කර මනා අත්දැකීම් සම්භාරයක් රැස්කරගත්තේ ය.

අනතුරුව ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරට සංක්‍රමණය කරන ඔහු එහි "කැරල් ඇන්ඩ් ඔබේ" නම් සුප්‍රකට නීති සමාගමේ ජ්‍යෙෂ්ට කොටස්කරුවකු බවට පත්වන්නේ සිය විශිෂ්ට පළපුරුද්ද හේතු කොටගෙන ය.

එයට අමතරව ඔහු නොට්‍රඩාම් පෞද්ගලික විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ මහාචාර්යවරයකු ලෙසද වගකීම් රැසක් උසුලන්නේ සිය දැණුම සමස්ථ සමාජයටම බෙදාදෙමින් ය.

නීති ක්ෂෙත්‍රයේ විවිධ විද්වත් සම්මන්ත්‍රණ සාකච්ඡා ආදියේදී කථිකයකු ලෙස සමත්කම් පෑ මෛත්‍රී විවිධ ප්‍රකාශන සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධන ද පැසසුමට ලක්ව ඇත.

සිංහල සහ ඉංග්‍රීසි ද්විභාෂා විද්වතකු ලෙස මෛත්‍රී ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ජන සමාජයට කරමින් සිටින සේවාව අති විශිෂ්ටය. ඔහු මෙසේ අගැයෙන්නේ ඒ සේවාව වෙනුවෙනි.

සම්මානයක අගය වටිනාකම රඳාපවතින්නේ එය ලබන්නා සම්මානයට සුදුසුද යන කාරණය මතය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සුදුසු'සෙකුට නිසි සම්මානයක් ලැබී ඇත. එය අපටද සතුටකි






## මගේ තාත්තා




මගේ තාත්තාගේ නම ලලිත් ගුණරත්න. තාත්තාට අවුරුදු පනහයි. ඔහු ඉතා කරුණාවන්ත හා ත්‍යාගශීලී පුද්ගලයෙක්. තාත්තාට හරි හොඳ ගතිගුණ තිබෙනවා. ඔහු ආගමට දහමට ඉතා ලැදි පුද්ගලයෙක්. තාත්තා උසයි. ඒ වාගේම කෙට්ටුයි. ඔහුට රැළි ගැසුණු කොණ්ඩයක් තිබෙනවා. ඔහු ඉතා පැහැපත්.

තාත්තා පවුලේ බාලයා. ඔහුගේ දෙමව්පියන් ගුරුවරු ලෙස සේවය කොට තිබෙනවා. තාත්තා පාසැල් දෙකකට ගොස් තිබෙනවා. ප්‍රථමික අධ්‍යාපනය දෙකටන පද්මාවතී මහා විද්‍යාලයෙන්ද ද්විතික අධ්‍යාපනය කොළඹ ආනන්ද විද්‍යාලයෙන්ද ලබා කැළණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යා උපාධිය ලබාගනෙ තිබෙනවා. ඔහු රසායනාඥයෙක් ලෙස සේවය කරනවා.

**තෙන්මී ගුණරත්න**
7/8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල
රොක්ස්බර්ග් පාක්.